# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2181/26 - 2020 ජුනි මස 26 වැනි සිකුරාදා - 2020.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය* : KO/DS/AD/FIL/68-16.

*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/2/2016/CEB/94.

මහජන කටයුත්තක් සඳහා පහත දක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 502A උඩුමුල්ල දකුණ ග්‍රාම නිලධාරී වසමේ උඩුමුල්ල ග්‍රාමයේ පිහිටි සර්වේ ජෙනරාල් විසින් පිළියෙල කරන ලද 2020.02.28 දිනැති පිඹුරු අංක "මු.පි. කො. 9885" හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.01914 (පර්චස් 07.54) ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කොටස:

මූලික පිඹුරු අංක මු.පි.කො. 9885 හි කැබලි අංක 01

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; වර්තමාන ඉඩම පරිහරණය: හිස් ඉඩම; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. එම්. එන්. ඩී. ආරියරත්න, අංක 371/1, උඩුමුල්ල, මුල්ලේරියාව නව නගරය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.01914.

ඉහත සඳහන් ඉඩම/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.08.13 වැනි දින පෙ.ව. 10.30 ට කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය. තවද, 2020.08.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එම්. ඒ. පී. ජයකොඩි,
ප්‍රාදේශීය ලේකම්,
කොලොන්නාව.

2020 ජුනි මස 25 වැනි දින,
කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 294

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KHDS/LND/03/ACQ/VIL/13-3.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2017/VE/428.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටකලන් කෝරළේ සුළු කොට්ඨාසයේ, ඇන්දාන ගමේ, අංක 227-B ඇන්දාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද, අ.ග.පි. 25, අතිරේක අංක 7, පත්‍ර අංක 8 හා 2019.11.30 දිනැති පිඹුරේ කැබලි අංක 84 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.6976 ක් වන පහත විස්තර කරන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 84**

ඉඩමේ නම: මහකුඹුරෙගොඩහේන, කැටවලගාවහේන සහ දංගහහේන; විස්තරය: අවුරුදු 20-30 ක් වයසැති තේ වගාව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කහවත්ත වැවිලි සමාගම, අංක 52, මාළිගාවත්ත පාර, කොළඹ 10; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 2.6976.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.07.29 වැනි දින පෙ.ව. 11.00 ට කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020 ජූලි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හෝ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

බී. ටී. ගයානි අයි. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2020 ජුනි මස 17 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 295

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : RBK/LAN/AQURE/A3/15.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2007/Z/283.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 9B, යෝදගම ග්‍රාම නිලධාරී වසමට අයත් යෝදගම ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල්ගේ අංක කෑ/3761 දරන මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

**කැබලි අංක 01**

ඉඩමේ නම: දොඩම්ගස්තැන්න පුරණ; විස්තරය: වත්ත, සිමෙන්තියෙන් බඳින ලද ලිඳක් ඇත; හිමිකම් කියන අය: දුනුගල් පේඩිගේ ගුණවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0949.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.09.30 වැනි දින පෙ.ව. 10.00 ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020.09.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්ලිව්. එල්. ආර්. ඉන්දික ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2020 ජුනි මස 18 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 325

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.